www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධය අවසන් කිරීමට සමාජවාදී වැඩපිළිවෙලක්

## A socialist program to end the war in Sri Lanka

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**
**2006 ඔක්තෝබර් 21**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) දෙමළ ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ශ්‍රී ලංකා ආන්ඩුව ගෙන යන මිලිටරි ප්‍රහාරය හෙළා දකී. එය දැනටමත් අහිංසක සිවිල් වැසියන් සිය ගනනකගේ ජීවිත බිලි ගෙන ඊටත් වඩා දැවැන්ත සංඛ්‍යාවක් සිය නිවාසවලින් පලවා හැර ඇත. නව යුද්ධය කොළඹ පාලක ප්‍රභූන්ගේ අවශ්‍යතාවන්ට සේවය කරන අතර එය එල්ල කොට ඇත්තේ ජනගහනයේ අති මහත් බහුතරයට -- දෙමළ, සිංහල හා මුස්ලිම් සියල්ලන්ට ම එක සේ -- විරුද්ධව ය.

රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් ගෙන ඒමට කැප වූ සාම දූතයකු බවට ජනාධිපති මහින්ද රාජපක්ෂ කරන හිස් කියා පෑම කම්කරු පන්තිය ප්‍රතික්ෂේප කල යුතු ය. පසු ගිය ජුලි මස සිට එල්ටීටීඊයේ මධ්‍යස්ථානවලට මිලිටරිය එල්ල කරන විවෘත ප්‍රහාර 2002 සටන් විරාමය නින්දිත ලෙස උල්ලංඝනය කිරීමක් මෙන් ම පූර්න-පරිමාන යුද්ධයක පෙරගමන්කරුවා ද වේ. ඇෆ්ඝනිස්තානයේ හා ඉරාකයේ එක්සත් ජනපද නායකත්වයෙන් යුත් මිලිටරි වාඩිලෑම්වලට පිටුබලය සපයා ඇති බලවතුන්ගේ මූලිකත්වයෙන් යුත් ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමය ගැන කිසිදු විශ්වාසයක් තැබීම ද කම්කරුවන්ට කල නොහැකි ය.

ඇත්ත වසයෙන් ම, කම්කරු පන්තිය කල යුත්තේ, යුද්ධයට ද යුදවාදයේ හා වර්ගෝත්තමවාදයේ ප්‍රභවය වන ලාභ ගරන ක්‍රමයට ද අවසන් තිත තබනු පිනිස ගම්බද දුගීන්, තරුන ජනයා හා මධ්‍යම පන්තික කොටස් රැලි කර ගැනීමේ ස්වකීය ස්වාධීන දේශපාලන ව්‍යාපාරයකට මූලිකත්වය ගැනීම යි. එමෙන් ම, කොළඹ ආන්ඩුවේ ප්‍රචන්ඩ ආක්‍රමනයට විරුද්ධ වන ලෙසත් ශ්‍රී ලංකාවේ සිය පන්ති සහෝදර සහෝදරියන්ට සහයෝගය දෙන ලෙසත් ඉන්දියානු උප-මහාද්වීපය හා ආසියාව පුරා සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය වෙත සසප කැඳවුම් කර සිටී.

රාජපක්ෂ මැතම මිලිටරි ආක්‍රමන සඳහා අන දුන්නේ, රැකියා, සේවා කොන්දේසි සහ මූලික සමාජ ප්‍රතිලාභ ආරක්ෂා කර ගැනීමට ගෙන යන කම්කරුවන්ගේ හා ගොවීන්ගේ වැඩෙන අරගල රැල්ලක් මධ්‍යයේ වීම අහම්බයක් නොවේ. සිවිල් යුද්ධය යලි ඇවිලවීමේ එල්ලය මහජනතාව ව්‍යාකූල හා භේද කොට ඔවුන්ගේ වැඩෙන කැරලිකාරිත්වය කුඩු පට්ටම් කිරීම යි. ආන්ඩුව හා මාධ්‍ය, වැඩ වර්ජිත කම්කරුවන් හා විරෝධතා දක්වන ගොවීන් "ත්‍රස්තවාදීන්ට" උදව් කරන්නන් ලෙස වඩ වඩා හෙලා දැක ඇත.

පසු ගිය මාස තුන තිස්සේ, මිලිටරිය මෝටාර්, කාල තුවක්කු සහ 23 අවුරුදු යුද්ධය තුල ප්‍රථම වතාවට තිරසර ගුවන් ප්‍රහාර යොදා ගෙන, එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට වග විභාගයක් නැතිව පහර දී තිබේ. මේ වන තෙක් සටන්වල දී අඩු ගනනේ සොල්දාදුවන්, එල්ටීටීඊ සටන්කරුවන් හා සිවිල් වැසියන් 1500ක් ඝාතනයට ලක්ව 240,000කට අධික ජන සංඛ්‍යාවක් අවතැන් වී තිබේ. මිනිසුන්, ගැහැනුන් හා ළමුන් 10,000ක් පමන දකුනු ඉන්දියාවට පලා ගොස් ඇත.

ප්‍රමානවත් ආහාර, ඖෂධ හා සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නොමැතිව මිලියන භාගයක් පමන ජනයා උතුරේ යාපන අර්ධද්වීපයේ හිර වී සිටී. ආරක්ෂක හමුදාවෝ, උතුරේ හා නැගෙනහිර යුද කලාප තුල මාර්ග බාධක, ඇඳිරි නීති සහ ප්‍රදේශ වටලා කරන හිතුවක්කාරී සෝදිසි මෙහෙයුම් ඇතුලු පියවර ගනිමින් යුද නීතියට සමාන තත්වයක් පනවා ඇත.

මෙහෙයුම දියත් කරනු වස් රාජපක්ෂ ඉදිරිපත් කරන කඩතුරාව මුලිමනින් ම වංචනික ය. එල්ටීටීඊ භූමි ප්‍රදේශ තුල පිහිටි මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීමට ජුලි මස ප්‍රධාන මිලිටරි මෙහෙයුමක් දියත් කිරීමට ඔහු අන දුන්නේ, එය අතිශයින් ම මානුෂික හේතු වෙනුවෙන් -- එනම් ජල මාර්ගය පහල ප්‍රදේශවල ගොවීනට ජලය සැපයීම සඳහා -- සිදු කරන්නක් බවට කියා පාමිනි. සත්‍ය කාරනාව නම්, ඔහුගේ ආන්ඩුව රටේ ගොවීන් සම්බන්ධයෙන් මොන යම් හෝ අනුකම්පාවක් දක්වා නැති බව යි. ගොවීන් මුහුන දෙන කොන්දේසි මොන තරම් නම් ඉවසිය නොහැකි ද කිය තොත් ඔවුන් දුසිම් ගනනක් සිය දිවි නසා ගැනීමට තල්ලු කෙරී තිබේ.

මාවිල්ආරු මෙහෙයුමේ අරමුන වූයේ ජලය සැපයීම නොව, භූමි ප්‍රදේශ අල්ලා ගැනීම සහ එල්ටීටීඊයට එරෙහිව වඩා පුලුල් ප්‍රහාර සඳහා යුක්තිකරනයක් ලබා ගැනීම යි. ජූලි 21 දා සහ යලිත් අගෝස්තු 5 දා. සොරොව්ව විවෘත කොට ගැටුම අවසන් කිරීමට ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) දැරූ ප්‍රයත්නයන් හමුදාව විසින් කඩාකප්පල් කරන ලදි. එම අවස්ථා දෙකේ දී ම, එස්එල්එම්එම් සාමාජිකයන්ගේ ජීවිත අවදානමේ හෙලමින් මිලිටරිය ප්‍රදේශයට ෂෙල් ප්‍රහාර එල්ල කලේ ය.

මාවිල්ආරු ගැටලුව පැන නැගීමට බොහෝ කලකට පෙර ම ආන්ඩුව හා මිලිටරිය එල්ටීටීඊයට එරෙහිව මූලික මෙහෙයුමක් සැලසුම් කිරීමේ යෙදී සිටියහ. පසු ගිය නොවැම්බරයේ දී රාජපක්ෂ ජනාධිපතිවරනයෙන් යන්තම් ජය ගැනීමේ පටන් මේ දක්වා හමුදාව හා එයට සම්බන්ධිත පැරාමිලිටරි කන්ඩායම්, එල්ටීටීඊය දුර්වල කිරීමේ හා එය ප්‍රතිප්‍රහාර සඳහා පොලඹවාලීමේ එල්ලය ඇතිව, එල්ටීටීඊ ආධාරකරුවන්ට හා එයට සහානුමතිය දක්වන්නන්ට එරෙහිව රහසිගත ඝාතන යුද්ධයක් ගෙන ගොස් තිබේ. මිලිටරි අන දෙන නිලධාරින් මාවිල්ආරු සොරොව්ව තෝරා ගත්තේ, එය නැගෙනහිර පලාතේ පිහිටි නිසා ය. 2004 දී සංවිධානය තුල සිදු වූ ප්‍රධාන භේදයකින් එම පලාත තුල එල්ටීටීඊය දුර්වල වී ඇති බවට ඔවුහු ගනන් බැලූහ.

එමෙන් ම, මිලිටරිය හා ඒ හා බැඳුනු පැරාමිලිටරි කන්ඩායම්, සමස්තයක් ලෙස දෙමල ජනතාවත් විශේෂයෙන් ම යුද්ධයට විරුද්ධ වන සෑම අයෙක් මත් ත්‍රස්ත කිරීමේ එල්ලය ඇතිව, පැහැර ගැනීම්වලින් හා නීතියට පරිබාහිර ඝාතනවලින් යුක්ත රහස් ව්‍යාපාරයක් ගෙන යමින් සිටිති.

අගෝස්තු 7 දා සසප ආධාරකරුවකු වූ සිවප්‍රකාශම් මරියදාස් ඝාතනය කිරීම මේ පිලිබඳ මූලික නිදසුනකි. නැගෙනහිර පලාතේ ගම්බද නගරයක් වන මුල්ලිපොතන පිහිටි ඔහුගේ නිවසේ දී මරියදාස්ට වෙඩි තබා ඝාතනය කරන ලදි. හඳුනා නොගත් ඝාතකයා යතුරු පැදියකින් පලා ගිය අතර සියලු සාක්ෂ්‍ය පෙන්නුම් කරන්නේ හමුදාව ඒ සඳහා වගකිව යුතු බව යි. ඝාතනයෙන් පසුව, මරියදාස් එල්ටීටීඊ සාමාජිකයකු බවට සාවද්‍ය කටකතා පැතිර වීමට හමුදාව ක්‍රියා කලේ ය. මේ දක්වා, මෙම ඝාතනය ගැන පොලීසිය කිසිදු බැරෑරුම් පරීක්ෂනයක් පවත්වා නැත.

## ජාත්‍යන්තර සන්දර්භය

සිය ආරම්භක මෙහෙයුම් "එල්ටීටීඊ ඉලක්කවලට එල්ල කෙරුනු සීමිත ප්‍රතිප්‍රහාර" බවත් මිලිටරි බල මධ්‍යස්ථානවලට එල්ල වන "එල්ටීටීඊ තර්ජන ව්‍යර්ථ" කර දමනු වස් ඒවා දිගට ම සිදු කෙරෙන බවත් ආන්ඩුව කියා පායි. මෙහි දී කොලඹ ආන්ඩුව අනුගමනය කරන්නේ බුෂ් පාලනාධිකාරයේ "පූර්ව-භංග යුද" පිලිවෙත යි. සදාම් හුසේන් තන්ත්‍රය විසින් මතු කෙරෙන තර්ජනය "ව්‍යර්ථ" කරනු සඳහා යැයි කියමින් ගෙන ගිය නීති විරෝධී ඉරාක ආක්‍රමනය පදනම් කෙරුනේ එම පිලිවෙත මත යි.

ඉරාකයේ හා වඩා පුලුල් ලෙස මැද පෙරදිග වොෂිංටනයේ ආක්‍රමනයට පිටුපසින් පවත්නා සැබෑ ගාමකය වන්නේ කලාපයේ තෙල් සිය පාලනයට ගැනීමට පවත්නා එහි අධිෂ්ඨානය යි. බුෂ් පාලනාධිකාරය, අන්තර්-අධිරාජ්‍ය ගැටුම්වල හා මිලිටරි ආක්‍රමනයන්ගේ නව කාල පරිච්ඡේදයක් විවෘත කරමින්, ජාත්‍යන්තර නීතියට අතිශය දඬබ්බර ලෙස සලකා ඇත. ඇෆ්ඝනිස්තානයේ හා ඉරාකයේ වොෂිංටනය සිදු කරන අපරාධවලට පිටුබලය දී ඇති කොලඹ ආන්ඩුව "ත්‍රස්තවාදයට විරුද්ධ ගෝලීය යුද්ධයේ" කුඩය යටතේ දිවයිනේ දෙමල සුලුතරයට එරෙහිව තමන්ගේ ම ආක්‍රමනයක් දියත් කර තිබේ. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය යලි ඇවිලවීමෙන් ඉවතට ජාත්‍යන්තර අවධානය අපසරනය කිරීමට උදව්කාරක වූ, එක්සත් ජනපද පිටුබලය ඇතිව ඊශ්‍රායලය ලෙබනනයේ සිදු කල සාපරාධී ආක්‍රමනය සමග කොලඹ ආන්ඩුවේ මිලිටරි මෙහෙයුම සම්පාත විය.

බුෂ් පාලනාධිකාරය කොලඹ ආන්ඩුව සෘජුව ම දිරිගන්වා ඇත. ජනවාරියේ දී, එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ් එල්ටීටීඊ නායකයන්ට කෙලින් ම අනතුරු අගවමින් කියා සිටියේ, ආන්ඩුවේ කොන්දේසි මත සාම සාකච්ඡාවලට යාම ඔවුන් ප්‍රතික්ෂේප කල හොත් "ඔවුන් මුහුන දෙනු ඇත්තේ වඩා ශක්තිමත්, වඩා හැකියාවන්ගෙන් යුත් හා වඩා අධිෂ්ඨානවත් ශ්‍රී ලංකා මිලිටරියකට" බව යි. පසු ගිය වසර හතර තිස්සේ එක්සත් ජනපද මිලිටරිය ශ්‍රී ලංකාවේ මිලිටරිය සමග වඩා සමීප සබඳතා වර්ධනය කර ගෙන තිබේ. මේ වසරේ දී ධවල මන්දිරය, ගැටුම් උත්සන්න වීම සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පවරමින්, ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස එල්ටීටීඊය තහනම් කිරීමට කැනඩාවට හා යුරෝපා සංගමයට බල කොට, එමගින් දෙමල විදේශගත ප්‍රජාව වෙතින් එයට දිගු කලක් තිස්සේ ලැබුනු දේශපාලන හා මූල්‍ය සහයෝගය කපා හැරීමට ක්‍රියා කලේ ය.

සියලු ම ප්‍රධාන හා කලාපීය බලවතුන් වොෂිංටනයේ පිලිවෙත අනුගමනය කරන්ට පටන් ගෙන තිබේ. එක්සත් ජනපදය සමග එක්ව, ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයේ ඊනියා සම-සභාපතිත්වය දරන යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ ශ්‍රී ලංකා මිලිටරිය 2002 සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කිරීම නොතකා හැර ඒ වෙනුවට ඔහුගේ "හික්මීම" ගැන රාජපක්ෂට ප්‍රශංසා කර ඇත. වඩාත් ම දරුනු ම්ලේච්ඡ ක්‍රියා -- අගොස්තු 4 දා මුතූර්හි දී සහන සේවකයන් 17ක් අමු අමුවේ මරා දැමීම සහ තරුන ශිෂ්‍යාවන් දුසිම් ගනනක් ඝාතනය කරමින් අගෝස්තු 14 දා මුලතිව්

දිස්ත්‍රික්කයේ පාසල් භූමියක් වෙත එල්ල කෙරුනු ගුවන් ප්‍රහාරයක් -- සම්බන්ධයෙන් කොළඹ ආන්ඩුව ගැන කෙරුනු ඇල් මැරුනු දොස් පැවරීම්වලට ජාත්‍යන්තර විවේචන සීමා වී ඇත.

එපමනක් නොව, යුද්ධය ඉල්ලා වඩ වඩා විවෘතව උද්ඝෝෂනය කර ඇති ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙළ උරුමයේ සිංහල අන්තවාදීන් සමග රාජපක්ෂ ගෙන යන සමීප සබඳතා පිලිබඳ කෙඳිරිල්ලක වත් ජාත්‍යන්තර විවේචනයක් මතු වී නැත. පෙබරවාරියේ දී සාම සාකච්ඡා අසාර්ථක වීම සහතික කිරීමට හේතු වූයේ, හමුදාවට වාසි වන පරිදි 2002 සටන් විරාමය මූලිකව සංශෝධනය කරන ලෙස ජවිපෙ කල ඉල්ලීමට ආන්ඩුව දුන් සහයෝගය යි.

ඔවුන්ගේ පාර්ශ්වයෙන් ගත් කල, ඉන්දියානු ආන්ඩුව, වැඩෙන මහජන වෛරය -- විශේෂයෙන් ම දකුනේ තමිල්නාඩු ප්‍රාන්තය තුල -- නොතකා නිහඬව බලා සිට ඇත. සිය තමිල්නාඩු සහාග හවුල්කරුවන් අස්වසනු පිනිස, නව දිල්ලියේ කොංග්‍රස් නායකත්වයෙන් යුත් ආන්ඩුව, දිගු කලක් තිස්සේ පොරොත්තු මට්ටමේ පවත්නා කොළඹ සමග වන ආරක්ෂක ගිවිසුමකට අනුමැතිය දී නැත. එම ගිවිසුම ශ්‍රී ලංකා මිලිටරියේ ධාරිතාවන් සැලකිය යුතු අයුරින් වර්ධනය කරනු ඇත. එමෙන් ම, එක්සත් ජනපදය සමග "මූලෝපායික හවුලක්" තනා ගෙන ඇති ඉන්දියාව, රාජපක්ෂ ආන්ඩුවට පිටුබලය දීමෙහි ලා හා එල්ටීටීඊය හුදකලා කිරීමෙහි ලා වොෂිංටනයේ නායකත්වය අනුගමනය කරමින් සිටී.

## "සාම ක්‍රියාදාමයේ" පාඩම්

ශ්‍රී ලංකාවේ සිටින විවිධාකර "වම්මුන්" තොරොම්බල් කරන මිථ්‍යාවන්ට ප්‍රතිකූලව, ශ්‍රී ලංකාවේ යුද්ධයට පවත්නා විකල්පය අසාර්ථක "සාම ක්‍රියාදාමය" කරා ආපසු යාමක් නොවේ. 2002 පෙබරවාරියේ දී ආකාරගත සටන් විරාමයක් අත්සන් කිරීමේ පටන් මේ දක්වා සිදු වි ඇති දේ ගැන දේශපාලන ශේෂ පත්‍රයක් සකසා ගැනීම අත්‍යවශ්‍ය ය. සාමය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ට සම්පන්න ජීවන තත්වයන් පිලිබඳව සාමාන්‍ය වැඩ කරන ජනයාට පවත්නා අවශ්‍යතා හා අභිලාෂයන් සපුරාලීම, ජාත්‍යන්තර අනුග්‍රහයෙන් යුත් සාම සාකච්ඡාවල එල්ලය ලෙස කිසිදාක පැවතුනේ නැත. එක්සත් ජනපදය සහ සෙසු මහ බලවතුන් සාම ක්‍රියාදාමයට පිටුබලය දුන්නේ දකුනු ආසියාව තුල සිය වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනය කරන යුද්ධයක් අවසන් කර ගැනීමේ විධි ක්‍රමයක් ලෙස ය. ශ්‍රී ලංකාවේ පාලක පන්තිය සම්බන්ධයෙන් ගත හොත්, එය, කම්කරු පන්තිය අන්‍යොන්‍ය වසයෙන් ආර්ථිකව සූරාකෑමේ සිය වැඩ කටයුතු උත්සන්න කර ගනු පිනිස සිංහල හා දෙමල ප්‍රභූ කොටස් අතර බලය බෙදා ගැනීමේ සැකැස්මක් තහවුරු කිරීමේ විධි ක්‍රමයක් විය.

සටන් විරාමය පැන නැංගේ තියුනු දේශපාලනික හා ආර්ථික අර්බුදයක් තුලිනි. 2000 අප්‍රේල් හා මැයි මාසවල දී, ශ්‍රී ලංකා මිලිටරිය, අලි මංකඩ සිය මූලික මූලෝපායික කඳවුරක් පෙර නොවූ විරූ ලෙස අහිමි වීම ඇතුලුව, එල්ටීටීඊය අතින් ව්‍යසනකාරී පරාජයන් මාලාවකට ම මුහුන දුනි. දශක දෙකක යුද්ධයේ සමුච්චිත ආර්ථික බලපෑම ප්‍රථම වතාවට 2001 දී ඍන වර්ධන අනුපාතයක් වාර්තා වීම ලෙස එලිමහනට පැමිනියේ ය. සංගත ප්‍රභූවේ වඩාත්ම බලගතු කොටස් සම්බන්ධයෙන් ගත හොත්, යුද්ධය මගින් සිදු කෙරුනු පාඩුව හා විනාශය, ශ්‍රී ලංකාව ගෝලීය ආයෝජන ප්‍රවාහයන්ගෙන් හුදකලා කොට රට ආර්ථික පසුගාමිත්වයට ඇද දැමූ ඉවසිය නොහැකි බරක් බවට පත්ව තිබුනි.

කෙසේ වෙතත්, තීරනාත්මක හැරුම් ලක්ෂ්‍යය වූයේ ශ්‍රී ලංකාවේ සිද්ධියක් නොව එක්සත් ජනපදයට එල්ල වූ සැප්තැම්බර් 11 ප්‍රහාරය යි. කොළඹ පාලනයට වාසි සහගත කොන්දේසි මත එල්ටීටීඊය සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීමේ අති විශේෂ අවස්ථාවක් බුෂ් පාලනාධිකාරයේ "ත්‍රස්ත විරෝධී යුද්ධය" මගින් ලබා දෙන බව ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූහු වහාම හඳුනා ගත්හ. එල්ටීටීඊය අනුකූල වීමට අපොහොසත් වූයේ නම් වොෂිංටනයේ ඉලක්කයක් බවට පත් වීමේ හැකියාවට එය මුහුන දෙනු ඇත. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ප්‍රමානවත් තරම් වේගයෙන් ක්‍රියාත්මක වීම ප්‍රතික්ෂේප කල විට, ශ්‍රී ලංකාවේ දිගු කාලීන සම්ප්‍රදායික ආකාරයට, පාර්ලිමේන්තුව තුල පිල් මාරුව සඳහා මන්ත්‍රීවරු ගනනාවකට අල්ලස් දීම මගින්, ඇගේ ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් ආන්ඩුව බලයෙන් පහ කරන ලදි. එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ එහි සගයන් 2001 දෙසැම්බර් මහ මැතිවරනය ජයගත් අතර අගමැති රනිල් වික්‍රමසිංහ ඉක්මනින් ම එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කලේ ය.

අන් සියල්ලටමත් වඩා එජාපයේ උත්සුකතාව සාමය නම් නොවී ය. මෙම පක්ෂය 1983 යුද්ධය ආරම්භ කිරීමත් දශකයක් තිස්සේ එය රුදුරු ලෙස ගෙන යාමත් සම්බන්ධයෙන් වගකිව යුතුව තිබුනි. වික්‍රමසිංහ සම්බන්ධයෙන් ගත හොත්, සාම සාකච්ඡා, දිවයින කලාපීය ආයෝජන මධ්‍යස්ථානයක්, එනම් දකුනු ආසියාවේ හොං කොං, බවට පරිවර්තනය කිරීමේ "යලි පුබුදමු ශ්‍රී ලංකා" නම් මහා සැලසුමේ කොටසක් විය. සුභ සාධක රාජ්‍යය කඩා බිඳ දැමීම, රාජ්‍ය ව්‍යවසායන් පුද්ගලීකරනය කිරීම, දිවයිනේ පොදු කාර්ය ව්‍යුහය පුනර්ජීවනය කිරීම සහ ව්‍යාපාරිකයන්ට හා විදේශ ආයෝජකයන්ට දැවැන්ත දිරි ගැන්වීම ලබා දීම පිනිස වෙලඳ පොල ප්‍රතිසංස්කරන නාටකාකාර

ලෙස වේගවත් කිරීමක් සමග එල්ටීටීඊය සමග බලය බෙදා ගැනීමේ සම්මුතියක් සඳහා වූ යෝජනා බැඳී පැවතුනි.

එල්ටීටීඊ නායකත්වය කනිෂ්ඨ හවුල්කරුවකු ලෙස උද්යෝගිමත්ව ගිවිසුමට අත්සන් කලේ ය. 2002 සැප්තැම්බරයේ පැවති පලමු සාකච්ඡා වටයේ දී, ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම්, දෙමල ඊලම් වෙනම රාජ්‍යයක් පිලිබඳ එල්ටීටීඊයේ දිගු කාලීන ඉල්ලීම ආකාරගතව අතහැර දමා "ව්‍යාප්ත ආර්ථිකයක්" නිර්මානය කරනු වස් ආන්ඩුව සමග සහයෝගීව කටයුතු කිරීමට පොරොන්දු විය. එල්ටීටීඊයේ ආස්ථානය මගින් ඒකාන්තයෙන් ම පෙන්නුම් කෙරුනේ, එය පෙනී සිටින්නේ දෙමල ජනයා අති මහත් බහුතරයක අවශ්‍යතා හා අභිලාෂයන් වෙනුවෙන් නොව, දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා වෙනුවෙන් බව යි. එල්ටීටීඊය බලාපොරොත්තු වූයේ දිවයිනේ උතුරේ හා නැගෙනහිර දෙමල ජනයා දඬු ගැසීමෙහි ලා, ෆෙඩරල් රාජ්‍යයක් තුල, දෙවන මට්ටමේ ක්‍රියාකලාපයකි.

කෙසේ වෙතත්, සටන් විරාමය, කොලඹ දේශපාලන සංස්ථාපිතය තුල ගැඹුරින් ම මුල් බැස ඇති දෙමල විරෝධී ස්වෝත්තමවාදය සමග ගැටුනු අතර යුද්ධය හරහා සිය තානාන්තර හා සමහර අවස්ථාවන්හි දී සිය පුද්ගලික ධන සම්පත් ද වර්ධනය කර ගෙන සිටි මිලිටරියේ කොටස්වල කෝපය ද අවුලුවාලී ය. කොලඹ නව පාලකයන් කැරලිකාර කම්කරු පන්ති ව්‍යාපාරයක් භේද කරනු වස් වාර්ගික දේශපාලනය මත පාදක වූ 1948 ආකාරගත නිදහස ලද අවස්ථාවේ පටන් ම, වර්ගෝත්තමවාදය ශ්‍රී ලංකා පාලක ප්‍රභූවේ මූලික අවියක් වී ඇත. එජාපය බලයට පත් වූ අවස්ථාවේ එහි ප්‍රථම ක්‍රියාවන්ගෙන් එකක් වූයේ, මිලියනයක් වන දෙමල කතා කරන වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිය අහිමි කිරීම යි. එතැන් පටන් සෑම මූලික දේශපාලන අර්බුදයක දී ම, කොලඹ පැවති ආන්ඩු, එජාපයේ නායකත්වය යටතේ වේවා නැතිනම් ශ්‍රීලනිපයේ නායකත්වය යටතේ වේවා, සිය පාලනය පවත්වා ගෙන යනු වස් දෙමල විරෝධී වර්ගවාදයේ හා ප්‍රචන්ඩත්වයේ සරන සොයා ගොස් ඇත. එය වනාහි 1983 සිවිල් යුද්ධය තුල කූටප්‍රාප්තියට පත් වූ ක්‍රියාදාමයකි.

ශ්‍රීලනිපය 2001 මහ මැතිවරනයෙන් පරාජයට පත් වූ නමුදු, කුමාරතුංග රටේ ජනාධිපති ලෙස දිගට ම සිටි අතර සටන් විරාමය කඩාකප්පල් කිරීමේ ප්‍රයත්නයන්ගේ කේන්ද්‍රය බවට පත් විය. 2003 සාකච්ඡාවල ඉස්මත්තේ දී නාවික හමුදාව ප්‍රකෝපකාරී ලෙස එල්ටීටීඊ මුහුදු යාත්‍රාවලට පහර දී ඒවා ගිල්වා දැමී ය. එල්ටීටීඊය සාම ක්‍රියාදාමයට එකග වීම මගින් මූලික සහන ගනනාවක් ලබා දී තිබුනත් එයට හිලව් වසයෙන් එයට කිසිවක් ලැබුනේ නැත. එහි ප්‍රතිවිපාකයක් ලෙස එය උතුරේ හා නැගෙනහිර වැඩෙන මහජන විරුද්ධත්වයකට මුහුන දුනි. ඔවුන් "ත්‍රස්තවාදී සංවිධානයක්" සාමාජිකයන් ය යන පදනම මත එල්ටීටීඊ නියෝජිතයන් වොෂිංටනයේ පැවති මූලික ජාත්‍යන්තර ආධාර සමුලුවකට සහභාගි වීම වලකාලීම මගින්, බුෂ් පාලනාධිකාරය තුවාලය තව දුරටත් පෑරීමට ක්‍රියා කලේ ය. එම මාසයේ ම පසු කාලීනව එල්ටීටීඊය සාකච්ඡාවලින් ඉවත් විය.

මිලිටරි ප්‍රකෝපකරනයන් හෙලා දැකීමට වත් කුමාරතුංග, ශ්‍රීලනිපය හා ජවිපෙ විසින් ආන්ඩුව හා සටන් විරාමය වඩ වඩා දරුනු ලෙස හෙලා දකිනු ලැබීමට එරෙහිව දේශපාලන උද්ඝෝෂනයක් ගෙන යාමට වත් වික්‍රමසිංහ අසමත් විය. සිය විරුද්ධවාදීන් මෙන් ම සිංහල ස්වෝත්තමවාදයේ ගිලී සිටින එජාපය තමන් එල්ටීටීඊයට රට පාවා දෙන්නේ ය යන චෝදනාව පිලිබඳව අතිශයින් ම සංවේදී විය. දීර්ඝ සාම ක්‍රියාදාමය පුරා ම යුද්ධයට දේශපාලන විසඳුමක් සඳහා වූ එකම යෝජනාව පැමිනියේ 2003 නොවැම්බරයේ දී එල්ටීටීඊය වෙතිනි. එනම් සාකච්ඡා යලි ඇරඹීමේ පදනමක් ලෙස අන්තර්-වාර ස්වයං පාලන අධිකාරියක් සඳහා එය ඉදිරිපත් කල සැලසුම යි.

ජවිපෙ වහාම එම යෝජනා පාවාදීමක් ලෙස හෙලා දැක බලය සියතට ගන්නා ලෙස කුමාරතුංගගෙන් ඉල්ලා සිටියේ ය. යන්තම් සතියක් ඇවෑමෙන්, ජනාධිපති ව්‍යවස්ථා කුමන්ත්‍රනයකට සම වන පියවරක් ගනු පිනිස සිය අති විශේෂ විධායක බලතල යොදා ගත්තා ය. ජාතික ආරක්ෂාව රැක ගැනීමේ නාමයෙන්, ආරක්ෂක අමාත්‍යාංශය ඇතුලු මූලික අමාත්‍යාංශ තුනක් පවරා ගත් ඇය හදිසි නීතිය පැනවීමට ද සූදානම් වූවා ය. පූර්න බලතල සියතට ගැනීමෙන් කුමාරතුංග පසු බැස්සේ වොෂිංටනයේ හා නව දිල්ලියේ පීඩනය යටතේ ය. කෙසේ වෙතත්, 2004 පෙබරවාරියේ දී, ඇය වික්‍රමසිංහ ආන්ඩුව වහාම බලයෙන් පහ කොට 2004 අප්‍රේල් මස පැවති නව මැතිවරනය තරග කිරීමට ජවිපෙ සමග මැතිවරන සන්ධානයකට එලඹුනා ය.

## යුද්ධය කරා ගිය ගමන

එජාපය මැතිවරනයෙන් පරාජයට පත් වූයේ බහුතරයක් ඡන්දදායකයන්ට යුද්ධය අවශ්‍ය වූ නිසා නොව, එහි ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලට එරෙහිව නැගුනු වෛරය හේතු කොට ගෙන ය. ප්‍රධාන පක්ෂ දෙකෙන් ම මහජනතාව පුලුල් ලෙස විරසක වීම නිසා, හිස් ජනතාවාදී පොරොන්දුවල හා ජාතිකවාදී සටන් පාඨවල පදනම මත උද්ඝෝෂනය කල ජවිපෙ සැලකිය යුතු වාසි ලබා ගැනීමට සමත් විය. 1960 ගනන්වල මාඕවාදී ගරිල්ලා සංවිධානයක් ලෙස ජවිපෙ ආරම්භ වූ අවස්ථාවේ පටන් ප්‍රථම වතාවට එහි නායකයෝ ජාතික මට්ටමේ ආන්ඩුවකට එක් වූහ.

නව සහාග ආන්ඩුව ද එහි පූර්වප්‍රාප්තිකයා මුහුන දුන් මූලික උභතෝකෝටිකයට ම මුහුන දුන්නේ ය. දේශපාලනිකව ගත් කල, මහජනතාව ව්‍යාකූල කිරීම හා භේද කිරීම පිනිස වර්ගවාදය ඇවිලවීම මත එය පදනම් විය. ආර්ථිකව ගත් කල, විදේශ ආයෝජන ප්‍රවාහය රට තුලට ඒම සහතික කරනු වස් එය සටන් විරාමය පවත්වා ගෙන යාම අවශ්‍ය විය. ජාත්‍යන්තර ආධාර දෙන කන්ඩායම එක්සත් ජනපද ඩොලර් බිලියන 4.5ක ආධාර පොරොන්දු වී තිබුනත් එය සාම සාකච්ඡා යලි ආරම්භ කිරීමට ගැට ගසා තිබුනි. සහාග ආන්ඩුව තථ්‍ය වසයෙන් ම පක්ෂාඝාත වී පැවතුනි. කුමාරතුංග සාම සාකච්ඡා යලි ඇරඹීමට පොරොන්දු වූ නමුත් සිය ජවිපෙ සගයන් විරසක වේ යැයි බියෙන් එම දිශාවට කිසිදු පියවරක් ගත්තේ නැත.

2004 දෙසැම්බරයේ දී, 30,000කට වඩා මරුමුවට පත් කරමින් හා 250,000කට නිවාස අහිමි කරමින් ශ්‍රී ලංකාවේ වෙරලබඩ ප්‍රදේශවලින් විශාල කොටසක් විනාශ කල සුනාමිය මගින් කුමාරතුංගගේ දේශපාලන ගැටලු තව දුරටත් සංකීර්න කෙරුනි. දශක ගනනාවක වාර්ගික දේශපාලනය තිබිය දී ම, සාමාන්‍ය වැඩ කරන ජනයා, ඔවුන්ගේ ජන වාර්ගිකත්වය, ආගම හෝ භාෂාව නොතකා, විපතට පත් ජනයාට ආධාර කරනු වස් ඉදිරිපත් විය. මූලික පන්ති සහයෝගිතාවයේ හා ආන්ඩුව කෙරෙහි පවත්නා අවිශ්වාසයේ පුලුල්ව පැතුරුනු මනෝගතියක් වර්ධනය විය: එනම් සෑම කෙනෙකුට ම තමන් එකම බෝට්ටුවේ සිටින බවත් එකිනෙකාට උදව් කල යුතු බවත් හැගුනි.

මහජනතාව ස්වේච්ඡාවෙන් ම ආධාර දීමට මූලිකත්වය ගැනීම සාදරයෙන් පිලිගන්නවා වෙනුවට කුමාරතුංග එයට ප්‍රතිචාර දැක්වූයේ හදිසි නීතිය පැනවීමෙන් හා සියලු සහන සේවා කටයුතු මිලිටරිය යටතට පත් කිරීමෙනි. සැලකිය යුතු මට්ටමේ ජාත්‍යන්තර පීඩනය යටතේ, ඇය සුනාමියෙන් විපතට පත් ජනයාට ආධාර සපයනු පිනිස එල්ටීටීඊය සමග ඒකාබද්ධ යාන්ත්‍රනයක් යෝජනා කලා ය. මෙම සීමිත තාවකාලික පියවර පවා ජවිපෙ විසින් හෙලා දකිනු ලැබුවේ එමගින් එල්ටීටීඊයට නිල පිලිගැනීමක් ලැබෙතැයි පවසමිනි. 2005 ජූනි මස කුමාරතුංග පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහයට (පී-ටොම්ස්) එකග වූ විට ජවිපෙ නායකයෝ ආන්ඩුවෙන් ඉවත් වී එම ගිවිසුමට එරෙහිව ජාතික පරිමාන විරෝධතාවක් දියත් කලහ. ඔවුන්ගේ දොම්නසට තුඩු දෙමින් එම උද්ඝෝෂනය දුක්මුසු ලෙස අසාර්ථක විය. ප්‍රධාන පක්ෂවලට විරුද්ධත්වය දැක්වීමක් ලෙස ජවිපෙට සහාය දී තිබූ බොහෝ දෙනෙක් වසරක කඩවුනු පොරොන්දු සහ පී-ටොම්ස් ගිවිසුමට විරුද්ධ ජවිපෙ වර්ගවාදී හෙලා දැකීම් හේතු කොට ගෙන එයින් විරසක වී සිටියහ.

2005 අගෝස්තුවේ දී, මෙම ආතති සහගත තත්වය තුල, විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කෙරුනු අතර එය සාම ක්‍රියාදාමයේ විරුද්ධවාදීන්ට ක්ෂනික මුක්කුවක් ලබා දුනි. ආරක්ෂාකාරී තත්වයක සිටි ජවිපෙ හා හෙල උරුමය, ඝාතනය සම්බන්ධයෙන් එල්ටීටීඊයට චෝදනා කරමින් හා ඒ ගැන වෙනත් මතයක් යෝජනා කරන ඕනෑම අයකු හෙලා දකිමින්, වහාම උද්ඝෝෂනයක් දියත් කලේ ය. ඝාතනයෙන් වසරකට වැඩි කලක් ගත වී ඇති තතු තුලත් ඒ සම්බන්ධයෙන් එල්ටීටීඊය වගකිව යුතු බවට කිසිදු නිශ්චිත සාක්ෂ්‍යයක් සොයා ගෙන නැත. තථ්‍ය වසයෙන් ගත් කල, අපරාධයෙන් දේශපාලන වාසි ලැබූ අය ම එය සිදු කල අය වීමට හොඳට ම ඉඩ ඇත. ජවිපෙ, හෙල උරුමය හා මිලිටරියේ කොටස් යන සියල්ලන්ට ම ඒ සඳහා මාර්ග හා ගාමකය මෙන් ම දේශපාලන ප්‍රචන්ඩත්වය සම්බන්ධයෙන් දිගු කාලීන ඉතිහාසයක් ද පවතී.

කදිරගාමර් ඝාතනය හැරුම් ලක්ෂ්‍යයක් සලකුනු කලේ ය. එකට එක කිරීමේ අවශ්‍යතාව ගැන කොලඹ සංස්ථාපිතය තුල පැවති ඝෝෂාව මධ්‍යයේ, පී-ටොම්ස් ඉක්මනින් ම අවලංගු ලියවිල්ලක් බවට පත් විය. අමතර වසරක් බලයේ සිටීමට කුමාරතුංග දැරූ ප්‍රයත්නයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරනය ඉක්මනින් ම තීන්දුවක් දුන් අතර නොවැම්බර් මස ජනාධිපතිවරනය කැඳවන ලදි. රාජපක්ෂ ශ්‍රීලනිප අපේක්ෂකත්වය ලබා ගැනීමට සමත් වූ අතර එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනික ආස්ථානයක් මත පදනම්ව ජවිපෙ හා හෙල උරුමය සමග මැතිවරන ගිවිසුම් ද අත්සන් කලේ ය. වික්‍රමසිංහගේ පටි තද කර ගැනීමේ ආර්ථික වාර්තාව කෙරෙහි ඡන්දදායකයන්ගේ වැඩෙන වෛරය ගසාකමින් අඩුම වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජය ගැනීමට රාජපක්ෂ සමත් විය.

## කම්කරු පන්තිය සඳහා ස්වාධීන වැඩපිලිවෙලක්

කම්කරුවන් අවශ්‍ය දේශපාලන පාඩම් උකහා ගැනීම තීරනාත්මක ය. පසු ගිය සිව් වසරේ සාම ක්‍රියාදාමයේ නින්දිත බිඳ වැටීම, නිදහසේ පටන් මේ දක්වා රටේ පාලක ප්‍රභූන් විසින් ගසා කන ලද වාර්ගික දේශපාලනයේ ඍජු නිෂ්පාදිතයකි. 65,000ක් ජනයාගේ ජීවිත බිලි ගත් 20-අවුරුදු සිවිල් යුද්ධයටත් ජන වාර්ගික, භාෂාමය හා ආගමික අගතීන්ගෙන් විෂ ගැන්වුන සමාජයකටත් තුඩු දී ඇත්තේ නිසැකව ම මෙම දේශපාලනය යි.

පාලක පන්තිය දැන් තමන්ගේ ම ආර්ථික අවශ්‍යතාවන්ට තර්ජනය කරන දැවැන්ත දේශපාලන යක්ෂයෙක් නිර්මානය කර ඇත. යුද්ධය අවසන් කොට ශ්‍රී ලංකාව ගෝලීය ධනවාදයට වඩා සමීපව ඒකාග්‍ර කිරීමේ ප්‍රයත්නයන්, සිංහල අධිපතිවාදය මත ගොඩනැගුනු රාජ්‍යයක මුල් බැස ලත් අවශ්‍යතා සමග ගැටෙන්ට පටන් ගෙන ඇත. මිලිටරියේ ඉහල

නායකත්වය, බෞද්ධ ධුරාවලිය, රාජ්‍ය නිලධරය සහ සමහර ව්‍යාපාරික ස්ථර යන මේ සියල්ලන් ම යුද්ධයෙන් වාසි ඩැහැ ගෙන තිබේ. එපමනක් නොව, ගැඹුරු වන සමාජ ධ්‍රැවාන්ත ගත වීමක් හා අසහනයක් නිර්මානය කරන වෙලඳ පොල ප්‍රතිසංස්කරන වැඩපිලිවෙලක් සමග "සාම ක්‍රියාදාමය" ඓන්ද්‍රියව ගැට ගැසී ඇත. වැඩ කරන ජනතාවගේ සමාජ අවශ්‍යතාවන්ට ආමන්ත්‍රනය කිරීමේ නොහැකියාවෙන් පෙලෙන කොලඹ පාලක ප්‍රභූන් වාර්ගික ආතීතන් ඇවිස්සීමේ හා සිවිල් යුද්ධය යලි ඇවිලවීමේ පිලිවෙතට යලිත් අත ගසා ඇත.

සමස්ත දේශපාලන සංස්ථාපිතය ම රාජපක්ෂගේ ආක්‍රමනික පිලිවෙත වටා රැලි වී සිටී. කම්කරු පන්තියේ ද්‍රෝහී පැරනි පක්ෂ -- ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ කොමියුනිස්ට් පක්ෂය -- ආන්ඩුවේ කොටසකි. නව සමසමාජ පක්ෂය (නසසප) වැනි විවිධ මධ්‍යම පන්තික රැඩිකල් සංවිධාන තමන් යුද්ධයට විරුද්ධ බව කියා පාන නමුත් නිල දේශපාලන රාමුවට මුලුමනින් ම බද්ධ වී ඇත. ඔවුන් තවමත් අසාර්ථක "සාම ක්‍රියාදාමයට" ඇලී ගැලී සිටීමත් නැති නම් ඔවුන් දක්ෂිනාංශික එජාප දේශපාලනඥයන් සමග ඔවුන්ගේ විරෝධතා ව්‍යාපාරවල දී එකම වේදිකාවේ පෙනී සිටීමත් පුදුමයක් නොවේ.

කම්කරු පන්තිය මෙම සියලු පක්ෂවලින් මූලිකව බිඳී ගත යුතු ය. යුද්ධයට විරුද්ධ වීමත් තමන්ගේ ම සමාජ අවශ්‍යතා සඳහා සටන් වැදීමත් පිනිස කම්කරු පන්තිය සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම මත පදනම් වන ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු ය. සිය ගමන් මාවත වෙනස් කරන ලෙස රාජපක්ෂ ආන්ඩුවට බලපෑම් දැමීමෙන් හෝ එජාප නායකත්වයෙන් යුත් සභාගයකින් එය විස්ථාපනය කිරීමෙන් යුද්ධය නතර කල නොහැකි ය. වර්ගෝත්තමවාදය හා යුද්ධය නිර්මානය කල ලාභ ගරන ක්‍රමය ම අහෝසි කල යුතු ය.

එයින් අදහස් කෙරෙන්නේ, කම්කරු පන්තිය තමන්ගේ ම උත්සාහයෙන් දේශපාලන බලය සඳහා සටන් වැදිය යුතු බව සහ එසේ කිරීමෙන් කම්කරු-ගොවි ආන්ඩුවක් තැනීම පිනිස නාගරික දුගීන්ගේ හා ගම්බද ජනයාගේ සහයෝගය රැලි කර ගත යුතු බව යි. එවන් අරගලයක් ගෙන යාම පිනිස, සාමාන්‍ය වැඩ කරන ජනයාගේ, එනම් ජනගහනයේ අති මහත් බහුතරයක, සමාජ අවශ්‍යතා හා ප්‍රජාතන්ත්‍ර අභිලාෂයන් සපුරාලන දේශපාලන වැඩපිලිවෙලක් අවශ්‍ය වේ.

කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම සඳහා අත්‍යවශ්‍ය පදනම වන්නේ, කොලඹ දේශපාලනඥයන්ගේ සිංහල අධිපතිවාදය හා එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය යන දෙක ම ඇතුලු ජාතිකවාදයේ, ජාතිවාදයේ හා වර්ගවාදයේ සියලු ම රූපාකාරයන්ට ක්ෂමා විරහිතව විරුද්ධ වීම යි. රාජපක්ෂ ආන්ඩුව වත්මන් යුද්ධය සම්බන්ධයෙන් පූර්න වගකීම දරන බව හඳුනා ගන්නා අතර ම, ආරක්ෂක හමුදාවන්, ඔවුන්ට අනුබද්ධිත දෙමල පැරා-මිලිටරි කන්ඩායම් හෝ එල්ටීටීඊය යන ඕනෑම පාර්ශ්වයක් විසින් සිදු කරනු ලබන වර්ගවාදී ම්ලේච්ඡ ක්‍රියාවන් සියල්ලට ම සසප විරුද්ධ වේ. අහිංසක සිවිල් වැසියන් ඝාතනය කිරීම වාර්ගික සතුරුකම් ඇවිලවීම ඉලක්ක කර ගෙන සිදු කෙරෙන අතර ඒවා මගින් හිතාමතාම වැඩ කරන ජනතාව එකිනෙකාට එරෙහිව පිහිටුවනු ලබයි.

යුද්ධය අවසන් කිරීම දෙසට ගැනෙන ප්‍රථම පියවර ලෙස සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටින්නේ, උතුරේ හා නැගෙනහිර යුද කලාපවලින් සියලු ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු බව යි. මෙම ප්‍රදේශවල සිටින දස දහස් සංඛ්‍යාත සොල්දාදුවන් හා පොලිස් භටයන් ක්‍රියාත්මක වන්නේ, ඔවුන් නිති පතා සිදු කරන හිරිහැර, හිතුවක්කාරී අත් අඩංගුවට ගැනීම්, වධ දීම් හා ඝාතන හේතු කොට ගෙන දෙමල ජනතාවගේ පිලිකුලට හා වෛරයට ලක්ව ඇති වාඩිලා ගත් හමුදාවක් ලෙස ය. මෙම පීඩනය අවසන් කිරීමට කැඳවුම් කිරීම, සාමය තහවුරු කිරීමටත් මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කර ගැනීමටත් අවශ්‍ය දිවයින පුරා සිටින සෑම අයෙක් ම ආකර්ෂනය කර ගන්නා බලගතු ධ්‍රැවයක් වනු ඇත.

නොවිසඳී පවත්නා සියලු ප්‍රජාතන්ත්‍ර ගැටලු විසඳලනු වස් සසප ඉල්ලා සිටින්නේ, භාෂාව, ආගම, කුලය හා ලිංග භේදය මත පදනම්ව කෙරෙන සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් නතර කොට සියල්ලන්ට ම ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහතික කරනු සඳහා නව ව්‍යවස්ථාවක් සකසා ගැනීමට අව්‍යාජ, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරා ගැනුනු ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් කැඳවිය යුතු බව යි. ශ්‍රී ලංකාවේ ජනතාව මත ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යවස්ථාවන් පැටවීම පිනිස 1972 දී හා 1978 දී සිදු කෙරුනු ව්‍යාජ පාර්ලිමේන්තු අභ්‍යාසයන්ගෙන් සසප පිලිවෙත මුලුමනින් ම වෙනස් වේ. මහජන ආරක්ෂක පනත හා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ඇතුලු සියලු මර්දන නීති අහෝසි කල යුතු යැයි සසප ඉල්ලා සිටී.

අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය මගින් අදහස් කෙරෙන්නේ, සෑම විට ම ධනවතුන්ගේ හා වරප්‍රසාදිතයන්ගේ වාසියට පවතින ධනේශ්වර නීති පද්ධතියේ හා පාර්ලිමේන්තු මැතිවරනවල ආකාරගත සමානත්වයට වඩා වැඩි දෙයකි. වැඩ කරන ජනතාවගේ පුලුල් කොටස්වල අවශ්‍යතා සඳහා සේවය කරනු වස් සමාජයේ ආර්ථික පදනම පරිවර්තනය කල යුතු ය. ධනවත් අතලොස්සක ලාභ අවශ්‍යතා නොව සමාජයේ අති මහත් බහුතරයක අවශ්‍යතා සපුරාලනු වස් සියලු මූලික මූල්‍ය, කාර්මික හා වානිජ ව්‍යවසායන් ප්‍රජාතන්ත්‍රවාදී පොදු අයිතියට

හා පාලනයට යටත් කිරීමේ සමාජවාදී වැඩපිළිවෙලක් සඳහා සසප සටන් වදින්නේ මේ නිසා ය.

සමාජවාදය දකුනු ආසියාවේ තනි, කුඩා දිවයිනක් තුල හෝ ඇත්ත වසයෙන් ම. විශාල හෝ කුඩා කිසිදු හුදකලා රටක් තුල ජය ගත නොහැකි ය. සමාජවාදය සඳහා වන අරගලය අවශ්‍යයෙන් ම ජාත්‍යන්තර ය. ගෝලීය ධනවාදයේ කොල්ලකාරී ක්‍රියාවන්ට පවත්නා එකම විකල්පය සමාජය සමාජවාදී පිලිවෙත් ඔස්සේ යලි ගොඩනැගීමට කම්කරු පන්තිය විසින් ගනු ලැබෙන ඒකාබද්ධ ජාත්‍යන්තර ප්‍රතිප්‍රහාරයකි. ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වන අරගලය දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා වන වඩා පුලුල් අරගලයක කොටසකි. මෙය හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හරහා සටන් වදින වැඩපිලිවෙල යි.

1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ලෙස පිහිටුවන ලද සසප හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන අතර එය කම්කරු පන්තියේ හා පීඩිත මහජනතාවගේ ප්‍රජාතන්ත්‍ර හා සමාජ අයිතීන් වෙනුවෙන් ස්ථිරසාරව මූලිකත්වය ගෙන සටන් වැද ඇත. සාමයට ලැදි සහ ප්‍රජාතන්ත්‍ර හා සමාජ අයිතීන්වලට එරෙහි ප්‍රහාරයන්ට විරුද්ධ වන සෑම අයෙක්ගෙන් ම අප ඉල්ලා සිටින්නේ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙස හා සසපට බැඳී එය ගොඩනැගීමට එක් වන ලෙස යි.

© www.wsws.org